**රඹුක්කන ප්‍රාදේශීය සභාව**

**<u>කෑගල්ල දිස්ත්‍රික්කය</u>**

**1** මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වටිනාකම රු. 75,475 ක් වූ වාහන 2 ක් මෝටර් රථ හා කරත්ත ගිණුමේ හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුමේ ගිණුම්ගත කර නොතිබීම ඉකුත් වර්ෂයේ වාර්තාව මගින් පෙන්වා දී තිබුණද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පුස්තකාල පොත් මිළදී ගැනීමේදී ආයතන තුනකින් ලැබී තිබුණු රු.45,989 ක වට්ටම්, ලැබූ වට්ටම්, වියදම්, පුස්තකාල පොත් සහ ප්‍රාග්ධනයට ආදායමෙන් දායක වීමේ ගිණුම්වල එම වටිනාකමෙන් අඩුවෙන් දැක්විණි.

(ඇ) ඖෂධ තොග ගබඩාවෙන් නිකුත්කරනු ලබන අවස්ථාවේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ගබඩාවට ද්‍රව්‍ය මිළදී ගන්නා අවස්ථාවේ වියදම් ලෙස ලියා හැරීම හේතුවෙන් වියදම රු.656,243 ක් වැඩියෙන් සහ අවසන් තොගය හා වර්ෂයේ අතිරික්තය එම වටිනාකමෙන් අඩුවෙන් දැක්විණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් සභාවට අයත් අක්කර 02 රූඩ් 02 පර්චස් 9.45 ක ඉඩම් කොටස් 06 ක වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2013 වර්ෂයේදී රු. 23,746,095 ක පළාත් සභා ප්‍රතිපාදන මත ඉදිකර 2014 සැප්තැම්බර් මස සභාවට භාරදී තිබුණු රඹුක්කන සතිපොළ ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි හා ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීමේ ගිණුම් එම වටිනාකමෙන් අඩුවෙන් දැක්විණි.

(ඊ) දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ව්‍යාපෘති තුනක් සඳහා 2017 දෙසැම්බර් 31 දිනට ලබාගෙන තිබූ ණය, එම අරමුදලේ අවකරණ උපලේඛන අනුව රු .19,835,052 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.5,830,064 ක් වූයෙන් ගෙවිය යුතු ණය ශේෂය රු.14,004,988 ක් අඩුවෙන් දැක්වුණි.

(උ) ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත කිරීමේදී වත්කම් වල වටිනාකම ද්වීගණනය වීම හේතුවෙන් ඉඩම් සහ ගොඩනැගිලි හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම්වල වටිනාකම රු.80,146,875 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

------------------------

ගිණුම් විෂයයන් 07 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 29,518,002 ක් වූ නමුත් ඊට අදාල උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.35,136,516 ක් වූයෙන් රු.5,618,514 ක වෙනසක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ඉක්ම වූ ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.19,927,198 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ඉක්ම වූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 6,420,009 ක් විය.

1.4 අනුකූල නොවීම්

--------------------

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූලනොවීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මු.රෙ.137 | 293,345 | ගෙවීම් වවුචර් අනුමත කිරීමෙන් තොරව දිනනකන්ද මාර්ගයේ පැති බැම්ම හා මාර්ගය කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. |
| (ii) මු.රෙ. 138 | 4,974,042 | වවුචර් සහතික කිරීමෙන් තොරව 2017 මාර්තු මාසය තුල අවස්ථා 23 කදී ගෙවීම් කර තිබුණි. |
| (iii) මු.රෙ. 371(ඇ) | 144,000 | අදාල කාර්යය අවසන් වූ වහාම හෝ එසේ නොහැකි නම් සතියක් නොඉක්මවා බිල්පත් පියවීම සිදුකළයුතු වුවත් 2017 වර්ෂය තුල අවස්ථා 11 කදී ලබාදුන් අත්තිකාරම් පියවීමේදී දින 08 සිට දින 52 දක්වා ප්‍රමාදයන් පැවතුණි. |

| | | |
|---|---|---|
| (iv) මු.රෙ. 396 (ඈ) | 113,666 | නිකුත්කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවා තිබුණු චෙක්පත් 67 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| (v) මු.රෙ. 571 | 3,856,990 | 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| (vi) මු.රෙ. 1645 (අ) | | ක්‍රමවත්ව, විධිමත්ව හා යාවත්කාලීනව ලොග් සටහන් පොත් පවත්වාගෙන යායුතු වුවත් සභාව භාරයේ පවත්නා වාහන 11 ක ලොග් පොත් පවත්වාගැනීමේ අඩුපාඩු පැවතුණි. |
| (vii) මු.රෙ. 1646 | | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊලඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් වාහන 05 ක ධාවන සටහන් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් විය. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | | සභාවට අයත් වාහන 17 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් කර නොතිබුණි. |
| (ඇ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | 152,696 | ආපදා ණය ශේෂය රු.250,000 ඉක්මවා නිලධාරීන් තිදෙනෙකුට ආපදා ණය නිකුත්කර තිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 103,452,041 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,595,422 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට මුළු 31 හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,836,286 | 21,283,524 | 5,956,228 | 1,422,307 | 5,939,031 | 5,739,325 | 3,230,867 | 1,970,837 |
| (ii) | කුලී | 9,382,345 | 10,007,368 | 9,891,842 | 728,303 | 6,939,435 | 8,189,093 | 7,928,263 | 672,484 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,787,641 | 3,971,182 | 3,966,152 | 5,030 | 5,783,750 | 3,572,821 | 5,724,321 | - |
| (iv) | වෙනත් ආදායම් | 6,295,500 | 89,661,332 | 89,661,332 | - | 5,505,500 | 7,935,484 | 7,935,484 | - |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු ආදායම, කුලී ආදායම්, බලපත්‍ර ගාස්තු ආදායම් හා වෙනත් ආදායම් පිළිවෙලින් සියයට 02, 05, 05 හා 1,324 කින් වැඩි වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු.1,299,636 ක් වූ අතර වර්ෂයකට වැඩි කාලයක සිට හිඟහිටි රු.934,880 ක් වූ වරිපනම් බදු අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි.

2.2.4 වෙනත් ආදායම්

(අ) හෝටල් බලපත්‍ර ගාස්තු

ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති හෝටල්,ආපනශාලා හා නවාතැන්පල වලින් බලපත්‍ර ගාස්තු අය කිරීමේදී එකී ආයතනවල වාර්ෂික පිරිවැටුමෙන් සියයට 1 දක්වා වූ මුදලක් ගාස්තු ලෙස අයකළ යුතු වුවත් හඳුනාගත් ආපනශාලා හා ලැගුම්හල් 03 කින් එලෙස ගාස්තු අයකර නොතිබුණි.

(ආ) දැන්වීම් පුවරු ආදායම්

සභා බලප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ලිඛිත බලපත්‍රයක් මත අවසරය ලබාගතයුතු වුවත් එවැනි අවසරයකින් තොරව ප්‍රදර්ශනය කළ ප්‍රචාරක දැන්වීම් පුවරු 12 කින් රු.90,750 ක් අයකරගෙන නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 1,004,957 ක් හා මුද්දර ගාස්තු රු. 29,199,182 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්

2013 වර්ෂයේ කුඩා නගර සංවර්ධන සැළැස්ම යටතේ පළාත් සභා ප්‍රතිපාදන මත රු.23,746,095 ක පිරිවැයක් දරා 2014 සැප්තැම්බර් 24 දින සභාවට භාර දී තිබුණු රඹුක්කන සති පොල 2017 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ එකතු වන කසළ වලින් කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ආරම්භ කර ඇති ව්‍යාපෘතිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කුලී පදනම මත ලබාගෙන තිබූ ඉඩමක පවත්වාගෙන යන අතර එම කාර්යය සඳහා ස්ථිර භූමියක් තෝරාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. එසේම කොම්පෝස්ට් නිෂ්පාදනයෙන් පසුව ඉතිරිවන කසළ බැහැර කිරීමද එම ඉඩම තුළම සිදුකර තිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පිරිවැය රු. 15,632 ක් වූ කොන්ක්‍රීට් හියුම් පයිප්ප දෙකක ඌණතාවය පියවා ගැනීමට හෝ සුදුස්සක් කිරීමට පියවර ගෙන නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2005 වර්ෂය හා 2014 වර්ෂය අතර කාලය තුළ සේවක ණය ලබාගෙන ස්ථාන මාරුවී ගිය සේවකයන් 07 දෙනකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 151,300 ක් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ 2010 නොවැම්බර් 16 දිනැති අංක සීඑම්/ඒඩී/20/03 දරන චක්‍රලේඛයෙන් අවධාරණය කර ඇති පරිදි කණිෂ්ඨ සේවකයන් වශයෙන් පත්වීම් ලබා ඇති අය පත්වීම් ලබා ඇති තනතුරෙහිම සේවයේ යෙදිය යුතු වුවත් සභාවේ වැඩ/ක්ෂේත්‍ර කම්කරුවන් 14 දෙනෙකු හා සෞඛ්‍ය කම්කරුවන් 06 දෙනකු වෙනත් රාජකාරී වල යොදවා තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂය වෙනුවෙන් 2016 වර්ෂයේදී ව්‍යාපාරික ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර තිබුණද එකී සමීක්ෂණය පදනම් කරගෙන සියළු ආයතන බදු ගෙවූ බවට තහවුරු කරගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපාර බදු ලේඛනය අනුව වාහන අළුත්වැඩියා ස්ථාන 08 ක්, කොන්ක්‍රීට් වැඩපල 09 ක්, දැව ඉරුම්හල් 03 ක්, වී මෝල් 05 ක් හා වඩුමඩු 02 ක් වශයෙන් ව්‍යාපාර ආයතන 27 ක් විසින් ව්‍යපාර බදු හා වෙළඳ බලපත්‍ර ලබා නොගැනීම මත සභාවට රු.108,000 ක ආදායමක් අහිමිව තිබුණි.

(ඇ) සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2017 වර්ෂයේ පළාත්පාලන මාර්ග සංවර්ධනයට අදාලව වටිනාකම රු. 4,327,550 ක් වූ කර්මාන්ත 07 ක් ඉටුකර නොතිබුණු අතර එම මුදල් මහජන සුභසාධනය සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ඇ) කඩ කාමර කුලියට දීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) රඹුක්කන නව පොදු වෙළඳ සංකීර්ණය 2017 සැප්තැම්බර් 25 දින විවෘත කර ඇතත්, 2018 අප්‍රේල් 25 දින වනවිටත් කඩ කාමර 17 ක පමණක් වෙළඳ කටයුතු ආරම්භ කර තිබුණි. එම කඩ කාමර සඳහා කුලිය අයකරගෙන නොතිබුණු අතර කඩ කුලී සම්බන්ධව කඩ හිමියන් සමඟ විධිමත් ගිවිසුම් වලට එළඹ නොතිබුණි.

(ii) එක්වන් මුදල් සියයට 60 බැගින් ලබාගෙන තිබුණු කඩ කාමර 18 ක වැඩ නිමකර නොතිබුණු බැවින් 2018 මාර්තු වනවිටත් කිසිදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

----------------------------

පළාත් පාලන අමාත්‍යාංශයෙන් හා සබරගමුව පළාත් සභාවෙන් ලැබී තිබූ රු.57,059,225 ක් වටිනා වාහන 24 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

------------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන වලින් වැය විෂයන් 20 ක එකතුව වූ රු.3,080,000 ක ප්‍රතිපාදන සියයට 100 ක් හා වැය විෂයන් 04 ක එකතුව වූ රු.1,225,000 ක ප්‍රතිපාදන වලින් සියයට 85 ත් සියයට 99 ත් අතර ප්‍රමාණයක් වූ එකතුව රු.4,305,000 ක් උපයෝජනය කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

------------------------

සභාවේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| ---------- | | -------------- |
| (අ) ගිණුම්කරණය | (i) | ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදුන් වැරදි නිවැරදි නොකිරීම |
| | (ii) | ජ,ර්නල් සටහන් සමඟ ඉදිරිපත් කරන සංලක්ෂ පැහැදිලි නොවීම |
| | (iii) | උපලේඛන ගිණුම් සමඟ නොසැසඳීම |
| (ආ) ආදායම් පරිපාලනය | (i) | හිඟ ආදායම් අයකර ගැනීමට නීතිමය කටයුතු නොකිරීම |
| | (ii) | ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් ලේඛන පවත්වා නොතිබීම |
| (ඇ) අයවැය පාලනය | (i) | ඇස්තමේන්තු ප්‍රතිපාදන වල සැලකිය යුතු ඉතිරිවීම් තිබීම |
| | (ii) | ඇස්තමේන්තු ආදායම් අයකර නොගැනීම |
| (ඈ) වත්කම් පාලනය | (i) | තක්සේරු කිරීම් යාවත්කාලීනව සිදුකර නොතිබීම |
| | (ii) | කිසිදු මූල්‍ය අගයක් ඇතුළත් නොකළ ඉඩම් ගොඩනැගිලි පැවතීම |
| | (iii) | ස්ථාවර වත්කම් ලේඛන දිරාපත්වී පිටු ගැලවී පැවතීම හා යාවත්කාලීනව පවත්වාගෙන නොතිබීම |